**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල - 2015**

-----------------------------------------------------------------------

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනිකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. භාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2 මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය ව්‍යාවනය**

-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

------------------------------

භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද සියයට පනහක කොටස් හිමිකාරිත්වයක් ඇති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර සමූහයේ ගිණුම් පිළියෙල නොකිරීම පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය වාර්තාකරණ සංකල්පීය රාමුවේ 4.56 පරිච්ඡේදය අනුව අස්ථිත්වයක් එහි මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය හෝ වෙනත් පදනම් අනුව පිළියෙළ කළ යුතු අතර එම පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. එසේ නමුත් භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 8 ඡේදයට අනුව, මූල්‍යමය වත්කම් හා වගකීම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෝ ගිණුම්කරණ සටහන්වල වර්ග කර දැක්විය යුතු වුවත් භාර අරමුදල විසින් එසේ සිදුකර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 31 සහ 33 ඡේද අනුව මූල්‍ය අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් හෙළිදරව් කළ යුතු වුවත් භාර අරමුදල විසින් එසේ හෙලිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 10 (ඇ) ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය භාර අරමුදල විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 38 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියළුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවද භාර අරමුදල විසින් ගිණුම් සටහන් වල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(iii) අරමුදල සතු රු.9,216,355,643 ක් වූ මූල්‍ය වත්කම් ප්‍රමිතයේ 60 ඡේදය පරිදි ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් ලෙස වෙන්කර හඳුනාගෙන නොතිබුණි.

(iv) ප්‍රමිතයේ 99 ඡේදය අනුව ආයතනයේ වියදම්වල ස්වභාවය හා ක්‍රියාකාරකම් අනුව වර්ගීකරණ පදනමකින් ආදායම් වියදම් ගිණුම් පිළියෙල කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 15 ඡේදය පරිදි දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒවා හඳුනාගන්නා අවස්ථාවේදී පිරිවැයට ගිණුම්ගත කළ යුතු වුවත් පොත් අගයට ගිණුම්ගතකර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

ප්‍රමිතයේ 30 (ඒ) ඡේදය පරිදි සඵලදායි පොළී අනුපාතය අනුව පොළී ගණනය කළ යුතු වුවත් භාර අරමුදල උපචිත පදනමට පොළී ගණනය කර තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24

-----------------------------------

ප්‍රමිතයේ 25 සහ 26 ඡේද අනුව සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකරනු ලබන ගනුදෙනු අනාවරණය කළ යුතු වුවත් භාර අරමුදල විසින් එසේ අනාවරණය කර නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39

-----------------------------------

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමනාකරණය කරනු ලබන ආයෝජන කළඹට අදාළව එම සමාගම විසින් ඉදිරිපත් කරනු ලැබූ ගිණුම් අනුව පැවති වටිනාකම රු.3,563,932,009 ක්වූ භාණ්ඩාගාර බැඳුම්කර, රු.1,051,300,440 ක්වූ භාණ්ඩාගාර බිල්පත්, රු.441,106,112 ක්වූ ප්‍රති විකුණුම්, රු.219,980,000 ක්වූ වරණීය කොටස්, රු.583,723,583 ක්වූ ණයකර , රු.750,136,185 ක්වූ Asset Back Trust Certificates, රු.612,507,068 ක්වූ ස්ථාවර තැන්පතු හා රු.262,022 ක්වූ ජංගම ගිණුමේ ශේෂය, ප්‍රමිතයේ 45 ඡේදය ප්‍රකාරව වර්ගකර භාර අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. තවද මෙම ආයෝජන අගය කිරීමේ පදනමද මූල්‍ය ප්‍රකශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40

-----------------------------------

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට (SLIIT) කුලී පදනමට ලබාදී තිබූ භාර අරමුදල සතු 2005 වර්ෂයේදී රු.12,460,179 ක වටිනාකමකට ගිණුම් ගතකර තිබූ මාලබේ පිහිටි අක්කර 25 ක ඉඩම ප්‍රමිතයේ 5 ඡේදය ප්‍රකාරව ආයතනයේ දේපලක් ලෙස වෙනම ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම මෙකී දේපල වර්තමාන අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරද නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ පරිපාලිත සමාගම් වූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම හා නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම සමාලෝචිත වර්ෂයට අදාලව පිළිවෙලින් රු.13,500,000 ක හා රු.100,000,000 ක ලාභාංශ ප්‍රකාශ කර තිබුණද එම ලාභාංශ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් ලැබිය යුතු බදු කුලී රු.110,309,022 ක් භාර අරමුදල විසින් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) භාර අරමුදලේ පාලිත සමාගමක් විසින් 2013 වර්ෂයටත් පෙර නිකුත් කරන ලද රු.100,000,000 ක් වටිනා ප්‍රසාද කොටස් භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඈ) සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත අනුව සමාලෝචිත වර්ෂයට අදාලව ජනාධිපති අරමුදලින් සංවර්ධන ලොතරැයි ලාභ කොටස ලෙස භාර අරමුදලට හිමි ලාභ කොටස රු.819,743,344 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වලට එම අගය රු.721,989,070 ක් ලෙස එනම් රු.97,754,274 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමනාකරණය කරනු ලබන මහපොළ ආයෝජන කළඹේ සමාලෝචිත වර්ෂයට අදාල ශේෂය එම සමාගම විසින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව රු.7,222,947,419 ක් වුවද මහපොළ භාර අරමුදලේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එම අගය රු.7,244,552,042 ක් වූයෙන් රු.21,604,623 ක පැහැදිලි නොකල වෙනසක් විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පාසැල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් වල එකතුව රු. 3,832,874 ක් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 6.2 වගන්තිය | භාර අරමුදලේ භාරකරුවකු විසින් සමාලෝචිත වර්ෂයේදී නව බැංකු ගිණුමක් ආරම්භ කර තිබුණ අතර චෙක්පත් අත්සන් කිරීමට භාර අරමුදලේ භාරකරුවන් දෙදෙනකුගේ හා පනතින් බලය පවරා නොතිබුණු රේඛීය අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම්ගේ ආදර්ශ අත්සන් බැංකුව වෙත ලබා දී තිබුණි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 හා 1980 අංක 16 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 44 වගන්ති | සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව අදාල කරගෙන නොතිබුණි.ඒ හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව එම අරමුදල වෙත පිළිවෙලින් රු.530,705 ක් හා රු.106,141 ක් අඩුවෙන් දායක මුදල් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාර අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 750,907,256 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.961,590,743 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.210,683,487 ක පිරිහීමක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විශ්ව විද්‍යාල සහ අනෙකුත් ආයතන සඳහා ශිෂ්‍යත්ව ප්‍රදාන ගෙවීම් රු.162,237,250 කින් අඩු වුවද ආයෝජන කළඹේ පොලී ආදායම රු.347,249,216 කින් අඩුවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 3 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2012 සිට සමාලෝචිත වර්ෂය දක්වා උච්චාවචන සහිතව අතිරික්තයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැළපීමේදී 2012 වර්ෂයේ රු.688,827,839 ක් වූ දායකත්වය 2013 වර්ෂයේදී රු.1,086,213,752 ක් දක්වා වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂය වනවිටත් එම දායකත්වය රු.759,207,222 ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

භාර අරමුදල විසින් වර්ෂ 2012 – 2015 කාලයට අදාලව පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මේ ළඟාකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් අගයන් දක්වා නොතිබුණු අතර එය පදනම් කරගත් ක්‍රියාකාරී සැලැස්මක් හා ප්‍රගති වාර්තා පිළියෙළ කර නොතිබුණු නිසා ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළදී භාර අරමුදලට ආයෝජන තැන්පත් පොලී හා සංවර්දන ලොතරැයි මණ්ඩලයෙන් ලැබුණු ආදායමේ එකතුව රු.මිලියන 1,692 ක් වූ අතර ඉන් රු. මිලියන 861 ක් එනම් සියයට 51 ක් පමණක් භාර අරමුදලේ අරමුණක් වූ මහපොළ ශිෂ්‍යත්ව ලබාදීම වෙනුවෙන් වැය කර තිබුණි. ඉතිරිය භාර අරමුදලේ අපේක්ෂිත අනෙකුත් අරමුණු ඉටුකිරීම සඳහා යෙදවීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. මෙලෙස අතිරික්තවන මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්සය අවසානයට ආයෝජන වටිනාකම රු. මිලියන 1,972 ක් විය.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

භාර අරමුදලේ ප්‍රධාන අරමුණක් වූ යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම සඳහා ශිෂ්‍යත්ව ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළව ශිෂ්‍යයින් විසින් ලබා නොගත් මහපොළ ශිෂ්‍යත්ව වාරික මුදල් එකතුව රු.38,787,150 ක්වූ අතර ඉන් රු.16,927,300 ක් විශ්වවිද්‍යාල හා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන මාස 04 සිට 07 දක්වා වූ කාලයක් රඳවාගෙන ආපසු අරමුදල වෙත එවා තිබුණි. නොගෙවූ ශිෂ්‍යත්ව වාරික මුදල් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙන්වා ගැනීමට සුදුසු පිළිවෙතක් අරමුදල විසින් අනුගමනය නොකිරීම නිසා එම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමෙන් ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ භාර අරමුදලට ලබා ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි ශිෂ්‍යයන්ට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන දොරටු විවර කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ ආයතනයක් භාර අරමුදලේ දායකත්වයෙන් පිහිටුවීමට 1998 ජූලි 08 දිනැති අංක 98/995/11/052 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය දී තිබුණි. ඒ අනුව අන්තර්කාලීන කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගමක් පිහිටුවීමටත් අන්තර් කාලය අවසානයේ එම ආයතනය මොරටුව විශ්වවිද්‍යාලය යටතට ගැනීමටත් අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 1999 ජනවාරි 28 දින පැවති රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ "ශ්‍රී ලංකා" යන නාමය ද ඇතුළත් කරමින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම පිහිටුවා ඒ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කරමින් සම්පත් දායකත්වය සැපයීමේ වගකීම මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) 2003 මාර්තු 19 වන දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම සමඟ එළඹි ගිවිසුම අනුව භාර අරමුදලට අයත් මාළඹේ ප්‍රදේශයේ පිහිටි අක්කර 25 ක භූමිය තුළ පිහිටවූ විශ්වවිද්‍යාලය අවුරුදු 8 ක කාලසීමාවකට කළමනාකරණය කිරීම සඳහා එම සමාගමට පවරා දී තිබුණි. එම ගිවිසුම් කාල සීමාව ඉක්මවීමට පෙර එනම් 2005 නොවැම්බර් 14 දින නැවත භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම අතර ගිවිසුමකට එළඹ ඇති අතර එහි දී මුල් ගිවිසුමෙන් භාර අරමුදලට වාසි සහගත වූ පහත සඳහන් කොන්දේසි ඉවත් කිරීම හා සංශෝධනය සිදුකර තිබුණි.

ඉවත් කළ කොන්දේසි

----------------------------

(i) 4 (ඉ) වගන්තිය (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ වෙනත් ශාඛාවන් හෝ භාර අරමුදලෙහි අරමුණුවලට අනුකූල නොවන වෙනත් කිසිඳු වාණිජ අරමුණක් වෙනුවෙන් මහපොළ විශ්ව විද්‍යාලයේ සියලුම වත්කම් හා ආදායම් සෘජුව හෝ වක්‍රව යොදා නොගත යුතු බව

(ii) 4(ඌ) වගන්තිය - විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු බව

(iii) 4(එ) වගන්තිය - අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමෙන් ලබන ආදායම් එකතුකිරීම හා විශ්වවිද්‍යාලයේ ශුභ සිද්ධිය උදෙසා අවශ්‍ය වියදම් දැරීම (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ වගකීමක් බව

(iv) 4(ක) වගන්තිය - විශ්වවිද්‍යාලය පිහිටුවීමේ අරමුණ සඳහා භාර අරමුදල විසින් ජාතික සංවර්ධන බැංකුවෙන් (NDB) සැලකිය යුතු ණය මුදලක් ලබාගෙන ඇති බවට (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අවබෝධ කරගත යුතු බවත් ආයතනය මූල්‍ය ශක්‍යතාවයෙන් හෙබි විට වාරික ගෙවීම සඳහා වූ සෑම ප්‍රයත්නයකටම (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය සහතික වන බව

(v) 4(ච) වගන්තිය- විශ්වවිද්‍යාලයේ කළමනාකරණය හා ගිණුම් පරීක්ෂාව හා අගය කිරීම සඳහා දක්ෂ කළමනාකරුවන් හා විගණකයන්ගෙන් සමන්විත ස්වාධීන පුද්ගල කණ්ඩායමක් පත්කිරීමේ අයිතිය හා අලුතෙන් හඳුන්වාදිය හැකි නව පාඨමාලා පිළිබඳ ඇගයීම සඳහා සුදුසුකම් ලත් උගතුන් හා දක්ෂ පුද්ගලයන්ගෙන් සමන්විත කණ්ඩායමක් පත් කිරීමේ අයිතිය භාර මණ්ඩලය සතු වන බව

(vi) 4(ඩ) වගන්තිය - භාර මණ්ඩල තීරණයට අනුව මාලඹේ විශ්වවිද්‍යාලය 'මහපොළ කැම්පස්' ලෙස නම් කිරීම, නව ශ්‍රවණාගාරය 'ලලිත් ඇතුලත් මුදලි ශ්‍රවණාගාරය' ලෙස නම් කිරීම හා මෙම නාම පුවරු පැහැදිලිව පරිශ්‍රය තුළ ප්‍රදර්ශනය කිරීම කළ යුතු බව

(vii) 4(ප) වගන්තිය - කාලය ඉකුත්වීම හේතුවෙන් හෝ වෙනත් ආකාරයකින් මෙම ගිවිසුම අවසන් වන අවස්ථාවේදී, භාර අරමුදල විසින් මූල්‍යයනය කරන ලද වත්කම් භාර අරමුදලෙහි දේපල ලෙස පැවතිය යුතු බව

සංශෝධනය කළ කොන්දේසි

------------------------------------

(viii) 2003 මාර්තු 19 වන දිනැති නෛතික ගිවිසුමේ 4(ඖ) වගන්තිය අනුව පැවති "එකඟ වූ කළමනාකරණ ගාස්තුව අඩුකිරීමෙන් පසු විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වන ආදායම්හි අතිරික්තය ඊළඟ වර්ෂයේ ජුනි 30 දිනට පෙර භාර අරමුදලට බැර කළ යුතු බව හා භාර අරමුදලෙහි භාර මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව අනිකුත් ආයෝජනයන් නොකළ යුතු බව සහ එසේ වුවද විශ්වවිද්‍යාලයේ අනාගත සංවර්ධනය සඳහා සංචිත ගිණුමක් පවත්වාගෙන යාමට (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාර අරමුදලෙහි භාර මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිය හැකි අතර එවැනි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් භාර අරමුදල විසින් මෙම සංචිත ගිණුමෙන් ලබා දිය හැකි බව" වගන්තිය වෙනුවට නව

ගිවිසුම මඟින් භාර අරමුදලට අයත් භූමිය බදු කුලී පදනම මත (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට බද්දට දීමට තීරණය කර තිබූ අතර ගිවිසුමේ 5(අ)(i) වගන්තිය අනුව වාර්ෂික බදු කුලිය ලෙස රු.මිලියන 8 ක් හෝ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි (SLIIT) වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 20 යන අගයන් දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු බවට එකඟතාවයට පත්ව ඇත.

(ix) භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර 2003 මාර්තු 19 වන දින ඇති කරගෙන තිබූ ගිවිසුමේ 4(ඕ) වගන්තිය අනුව විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් වූ සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ කිරීමේ අයිතිය භාර මණ්ඩලයට නියම වූ අතර විශ්ව විද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා කරනු ලබන සියලු කටයුතු භාර අරමුදලේ එකඟතාවය මත සිදුකළ යුතු විය.එසේ වුවද භාර අරමුදල හා (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර 2005 නොවැම්බර් 14 වන දින ඇති කරගෙන තිබූ දෙවන ගිවිසුමේ 4 (ඉ) සහ 4 (ඊ) වගන්තිවලට අනුව (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව තීරණය කරනු ලබන ආකාරයට මෙම විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමටද, ඒ අනුව වක්‍රලේඛ පිළියෙල කිරීම, විභාග පැවැත්වීම සඳහා සූදානම් කිරීම, සිසුන් බඳවා ගැනීම, අධ්‍යයන කාර්යය මණ්ඩලය සේවයේ යෙදවීම, කළමනාකරණය හා යටිතල පහසුකම් නඩත්තුව (SLIIT) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි සිදුකිරීමට ද ප්‍රධාන ඉදිකිරීම්වලදී පමණක් භාර අරමුදලෙහි අනුමැතියට යටත්ව කටයුතු කළ බව, එකඟත්වයට පත්ව ඇත.

(ආ) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල විසින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගමට සිදුකරන ලද වියදම් ලෙස රු.373,579,392 ක ආයෝජන වටිනාකමට සරිලන මුදලක් නැවත අරමුදල වෙත ලබාදීම හා එමගින් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, භාර අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම අතර (SLIIT) ඉදිකර ඇති ඉඩම වෙනුවෙන් ඇති කරගත් කල්බදු ගිවිසුම ලෙස ගිවිසුම් දෙකකට 2015 මැයි 12 දින එළඹ තිබුණි.

උක්ත ගිවිසුම් දෙක මගින් 2003 මාර්තු 19 වන දින ඇති කර ගත් මුල් ගිවිසුම හා 2005 නොවැම්බර් 14 දින ඇති කර ගත් ගිවිසුමෙන් භාර අරමුදලට වාසිසහගත වූ කොන්දේසි තවදුරටත් ඉවත් කර පහත සඳහන් නව කොන්දේසි ඇතුලත් කර තිබුණි.

(i) භාර අරමුදල විසින් සිදුකළ ආයෝජන වටිනාකම ලෙස රු.373,579,392 ක් හා මහපොළ නමින් ලබාදුන් ශිෂ්‍යත්ව වටිනාකම සහ අනෙකුත් අනුෂාංගික වියදම් ආවරණය කිරීම සඳහා භාර අරමුදලට රු.408,500,000 ක මුදලක් ලබා දෙන බවත් ඉන් පසු මහපොළ අරමුදල හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර කිසිඳු මූල්‍යමය බැඳියාවක් නොමැති බව හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය මහපොළ අරමුදලින් වෙන්වූ ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාකරන බව

(ii) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය කිසිඳු ගිණුම්කරණ ප්‍රමිතියකට, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියකට හෝ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතියකට යටත් නොවන අතර මහපොළ අරමුදල වෙත ගිණුම් වාර්තා ලබා දීමට හෝ 2015/2016 වර්ෂයේ සිට ගිණුම් ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවලින් නිදහස් කර ඇති බව

(iii) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය පිහිටුවා ඇති මාළඹේ පිහිටි ඉඩම අවුරුදු 5 කට වරක් වාර්ෂික බදු කුලිය වැඩිවන පදනමින් 2015 මැයි 15 සිට 2075 මැයි 14 වන තෙක් අවුරුදු 60 ක් සඳහා බදු දීමත් 2020 මැයි 14 න් අවසන් වන අවුරුදු 5 සඳහා වාර්ෂිකව රු. මිලියන 20 බැගින් ද වන පරිදි 2070 මාර්තු 15 සිට 2075 මාර්තු 14 න් අවසන් වන වර්ෂ 5 සඳහා වාර්ෂිකව රු. මිලියන 40 බැගින් වන පරිදි බදු කුලී ගෙවීමට බැඳී ඇති බව

(iv) මහපොළ අරමුදලේ හිමිකාරිත්වය සතු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය වෙත බදු දී ඇති මාළඹේ පිහිටා ඇති ඉඩම හෝ එහි කොටසක් උප බදු දීම, උකසට තැබීම සඳහා මහපොළ අරමුදලේ කිසිදු ලිඛිත අවසරයක් අවශ්‍ය නොවන බව

(v) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට ඔවුන්ගේ වියදමින් අදාළ භූමි පරිශ්‍රය තුළ ගොඩනැගිලි ඉදිකිරීම, යන්ත්‍රෝපකරණ සවිකිරීම හෝ අදාළ භූමිය ප්‍රතිසංස්කරණ, වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කිරීමට අවසර ලබා දී ඇති බව

(ඇ) 2005 නොවැම්බර් 14 දින ඇති කරගෙන තිබූ ගිවිසුම අනුව 2015 මැයි 12 වන විට හිඟ හිටි බදු කුළිය රු.98,642,356 ක් ව තිබියදී 2015 මැයි 12 දින සමාගම සමඟ නව කල්බදු ගිවිසුමකට එළඹ තිබුණි. 2005 නොවැම්බර් 14 දිනැති මුල් ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයට අදාලව භාර අරමුදලට ලබාගත හැකිව තිබූ රු. 45,358,379 ක බදු කුලිය නව ගිවිසුමේ කොන්දේසි අනුව රු. 20,000,000 දක්වා අඩු වී තිබීම.

(ඇ) 2015 මැයි 12 දින ඉහත පරිදි ගිවිසුම් වලට එළඹීමෙන් පසුව ද සමාලෝචිත වර්ෂයේ මහපොළ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ කළ ආයෝජන ලෙස රු.1,064,520,695 ක් ගිණුම් ගත කර තිබීම.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, භාර අරමුදලේ 2015 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 08 වන දිනදීය.

### 5.2 අභ්‍යන්තර විගණනය

---------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින්ද අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 5.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

### 5.3.1 ප්‍රසම්පාදනයන්

-----------------

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 6 (2)(ඇ) වගන්තිය ප්‍රකාරව අරමුදලේ අරමුණු ඉටුකිරීමට අවශ්‍ය අරමුදල් රැස්කර ගැනීමේ අරමුණින් 2013 ජූලි 11 දිනැති 13/0773/54/008 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත "මංගත ලොතරැයිය" 2013 ජූලි 30 දින නැවත ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මංගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීමේදී බලයලත් පාර්ලිමේන්තු පනත් දෙකක් අනුව පිහිටුවා ඇති ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් මෙම ලොතරැයිය ක්‍රියාත්මක කරවා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලා නොතිබුණි.

(ආ) ආයතනය විසින් පෞද්ගලික ආයතනයක් මගින් ලොතරැයිය ක්‍රියාත්මක කරවා ගැනීමට කටයුතු කර තිබූ අතර ඒ සම්බන්දයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පළමු හා දෙවන අදියර යටතේ රු.බිලියන 6ක් ආයෝජනය කරමින් ලොතරැයිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජනකරුවෙකු තෝරා ගැනීම සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යවරයාගේ යෝජනාවක් අනුව පස් දෙනෙකුගෙන් සමන්විත ''මහපොළ ලොතරැයි කමිටුව'' නමින් විශේෂ කමිටුවක් 2012 ජූලි 12 දින භාරකාර මණ්ඩලය විසින් පත්කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.2 (ආ) වගන්තිය පරිදි ප්‍රසම්පාදන ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි.

(ii) ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 වගන්තිය පරිදි සම්මත ලංසු ලේඛන භාවිතාකර නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුවක්ද පත්කර නොතිබීම හේතුවෙන් භාවිතාකර තිබුණු ලංසු ලේඛන තාක්ෂණ ඇගයීම් කමිටුවක් විසින් පරීක්ෂාකර අනුමත කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය පරිදි ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 21ක කාලයක් ලබාදිය යුතු වුවද, ඒ සඳහා දින 10 ක කාලයක් පමණක් ලබාදී තිබූ අතර ලැබුණු ලංසු ප්‍රමාණය 3 කට සීමා වී තිබුණි.

(iv) ලංසු ඇගයීම් කමිටුවක් පත්කර නොතිබීම හේතුවෙන් විස්තරාත්මක ලංසු ඇගයීමක් සිදු නොකර ලොතරැයි කමිටුව විසින් ලංසු සැසඳීමක් පමණක් සිදුකර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 වගන්තිය අනුව, ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු ''ඍජුවම සුදුසු බව'' තහවුරු කෙරෙන උපමාන යන සුදුසුකම ලංසු කැඳවීමේ ආරාධනාවට ඇතුළත් කළ යුතු වුවත් එය ඇතුළත් කර නොතිබියදී ඉදිරිපත්ව තිබූ ලංසු තුන අතුරින් පැහැදිලි තොරතුරු ඉදිරිපත් නොකළ බව සඳහන් කරමින් එක් ලංසුවක් ප්‍රතික්ෂේප කර තිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12 වගන්තිය පරිදි ඵලදායී තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හැකියාව පැවතියද ඒ අනුව කටයුතු නොකර මාර්ගෝපදේශ 7.10 වගන්තිය පටහැනි ලෙස අනෙකුත් සම්පත්, මූල්‍ය තත්ත්වය හා පළපුරුද්ද නොසළකා ආයෝජනය කළ සමාගමකින් ඉදිරිපත් කළ ලංසුවක් සම්බන්ධයෙන් අදාළ සමාගම ඇගයීම වෙනුවට රු. බිලියන 6 ක ලංසුව ඉදිරිපත් කළ සමාගමක ප්‍රධාන ආයෝජකයෙකු වූ විදේශිකයෙකු ඇගයීමට ලක්කර තිබුණි. තවද අදාළ සමාගම ලියාපදිංචියේදී ලොතරැයි ක්‍රියාත්මක කිරීම අරමුණක් ලෙස දක්වා නොතිබුණි.

(vi) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය අනුව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් පිළියෙල කළ යුතු වුවද තෝරාගත් ලංසුකරු විසින් ගිවිසුම පිළියෙල කර තිබුණි. එබැවින් "මහපොළ ලොතරැයිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මූලික මෙහෙයුම් මාර්ගෝපදේශයේ" 6,8,9,14,15,16,17 හා 20 යන කරුණු ගිවිසුමෙන් ඉවත්කිරීම නිසා ලොතරැයියේ මෙහෙයුම් කටයුතුවල හා කාර්යසාධනයේ විනිවිදභාවයක් නොවීය.

(vii) ගිවිසුමේ 7.1(ආ) වගන්තිය අනුව කොන්ත්‍රාත්කාර සමාගම වාරික මුදල් කාර්තුව ආරම්භ වන දින හෝ එදිනට පෙර භාර අරමුදලට ගෙවිය යුතු විය. එසේ නොගෙවුවහොත් එදින සිට දින 90 ක් ඇතුළත කොන්ත්‍රාත්තරුට භාර අරමුදල විසින් ඒ බව ලිඛිතව දැන්වීම සහ එදින සිට දින 14 ක් ඇතුළත ගිවිසුම අවලංගු කල යුතු විය. එහෙත් 2015 මැයි 05 දින සිට මුදල් ගෙවීම හිඟ හිට තිබූ නමුත් භාර අරමුදල විසින් ඒ බව ලිඛිතව දන්වා නොතිබූ අතර 2015 අගෝස්තු 5 දින සිට දින 14 ක් ඇතුළත ගිවිසුම අවසන් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ගිවිසුම අවසන් කර නොතිබූ අතර එදිනට හිඟ වාරික මුදල රු.375,000,000 ක් විය.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර භාර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අභ්‍යන්තර පාලනය | ගණකාධිකාරි තනතුර සඳහා නිලධාරියකු බඳවා ගෙන නොතිබීම. |
| (ආ) | මූල්‍ය පාලනය | නිසි අනුමැතියකින් තොරව ආයෝජනය කිරීම හා ආයෝජන ප්‍රතිලාභ ඇගයීම් නොකිරීම. |
| (ඇ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ප්‍රසම්පාදන අත්පොත හා ප්‍රසම්පාදන සැලසුම් අනුව කටයුතු නොකිරීම. |